# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date |
| --- | --- | --- |
| SA/SD/1/1/20 | | 2019.09.10 |

ආයතන ප්‍රධානීන්
සියලුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත

අවධානය - ප්‍රධාන මූල්‍ය නිලධාරි / ප්‍රධාන ගණකාධිකාරි

**<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ වූ</u>**

**<u>මිය ගිය නිලධාරීන්ගේ/ සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම</u>**

අත්තිකාරම් "බී" ගිණුමට අදාල නිරවුල් නොවූ ණය ශේෂ විධිමත් වැඩපිළිවෙලක් යොදා කඩිනමින් නිරවුල් කර ගැනීම පොදුවේ ගණන් දීමේ නිලධාරියාගේ මෙන්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ ද වගකීමක් වන අතර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කර ගිණුම් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම හා නිරන්තර අධීක්ෂණය කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ඔබ ආයතනය වෙනුවෙන් යොදා ගැනීමේ අවශ්‍යතාවය ආයතනයේ නිරවුල් නොවී අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ලබන ණය ශේෂ පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වේ.

02. රජයේ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ විවිධ හේතුන් නිසා දීර්ඝ කාලයක් අදාල දෙපාර්තමේන්තු පොත්වල අය නොවී පැවතීම එම ආයතනවල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ශේෂය ඉතා ඉහල අගයක් ගැනීමට හේතු වී ඇති අතර මේ සම්බන්ධව රාජ්‍ය ගිණුම් කාරක සභාවේද දැඩි අවධානයට ලක්වී ඇත. මෙම හිඟ ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීම සඳහා ආයතන ප්‍රධානියා ලෙස ඔබගේ පෞද්ගලික අවධානය යොමු විය යුතු බවට කාරුණිකව දන්වා සිටිමි.

03. මෙතෙක් නිරවුල් නොවූ ණය ශේෂයන්ට ඇතුලත් මිය ගිය නිලධාරීන්ගේ ණය සහ සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය යන කාණ්ඩ දෙක වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ නිකුත් කරන ලද ඇපයක් මත, රක්ෂණ භාර අරමුදලේ ඇපයක් මත හෝ පුද්ගල ඇප මත ණය ලබා ගෙන ඇති හා ඇප තබා නොමැති, මරණ පාරිතෝෂික සඳහා හිමිකම් පා නොමැති නිලධාරීන්ගේ ණය වශයෙන් ඉතා නිවැරදි වර්ගීකරණයක් අවශ්‍ය වී තිබේ.

04. ඒ සඳහා අවශ්‍ය ණය පිළිබඳ තොරතුරු ඇමුණුම 01 හා 02 හි දක්වා ඇති ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කර 2019.09.20 දිනට ප්‍රථම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මෘදු පිටපතක් ද සහිතව (MS Excel මගින්) ලබා දීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

05. මේ සඳහා විද්‍යුත් තැපැල් ලිපිනය <u>loaninfor@sad.treasury.gov.lk</u> භාවිතා කළ හැකිය

ආර්.එම්.ඒ. රත්නායක
අධ්‍යක්ෂ ජනරාල්


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk

Annexure - A

**Loan Balances of Deceased Officers - As at 31.08.2019**

| Serial No. | Officer's Name | Death Gratuity | | N.I.C. Number | Variety of Loan | * Details of the Guaranty | Loan Balance (Rs.) | Total Loan Balance (Rs.) |
|---|---|---|---|---|---|---|---|---|
| | | Claimed or not | Recovered or Not | | | | | |
| 1 | eg. Nimal Perera | No | No | xxxxxxxx | Distress | A | XXX | |
| | | Yes | No | | Festival | D | XXX | |
| | | No | No | | Property | C | XXX | XXXX |
| | | | | | | | | |
| 2 | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

Use the following letters When Including the details of the Guaranty

A - Loans with Personal Guarantee
B - Loans with Guaranteed by the National Insurance Trust Fund
C - Loans with Guaranteed by the Insurance Corporation
D - Loan without Guaranty (Officers over 10 year of service period/Loan without Guaranty)

you are kindly informed to send a certified copy of the Guaranty certificate of Loans which Guaranteed by the National Insurance Trust Fund and Insurance Corporation

Annexure - B

**Loan Balances of officers who Vacated of Post - As at 31.08.2019**

| Serial No. | Officer's Name | N.I.C. Number | Variety of Loan | * Details of the Guaranty | Loan Balance (Rs.) | Total Loan Balance (Rs.) |
|---|---|---|---|---|---|---|
| 1 | eg. Nimal Perera | xxxxxxxx | Distress | A | XXX | |
| | | | Festival | D | XXX | |
| | | | Property | C | XXX | XXXX |
| | | | | | | |
| | | | | | | |
| 2 | | | | | | |
| | | | | | | |
| | | | | | | |

Use the following letters When Including the details of the Guaranty

A - Loans with Personal Guarantee
B - Loans with Guaranteed by the National Insurance Trust Fund
C - Loans with Guaranteed by the Insurance Corporation
D - Loan without Guaranty (Officers over 10 year of service period/Loan without Guaranty)

you are kindly informed to send a certified copy of the Guaranty certificate of Loans which Guaranteed by the National Insurance Trust Fund and Insurance Corporation